**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වෛද්‍ය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී

පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව කල්පිරීමේ කාලය වර්ෂයක් වන ස්ථාවර තැන්පතු ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වුවත්, සභාව විසින් කල් පිරීමේ කාලය වර්ෂයක් වූ එ. ජ. ඩො. 23,500 ක (රු. 7,612,198) ස්ථාවර තැන්පත් ශේෂය හා රු. 268,474,357 ක් වූ භාණ්ඩාගාර බිල්පත් 02 ක පිරිවැය ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | එකඟ වන බව, 2024 වසරේදී අදාළ පරිදි නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 16 ඡේදයට අනුව ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් වලට අදාළව මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් වෙන් වෙන්ව පෙන්නුම් කළයුතු වුවද ඊට අනුකූල නොවී ස්ථාවර තැන්පතුවල ශුද්ධ වෙනස් වීම වූ රු.120,553,831 ක් හා භාණ්ඩාගාර බිල්පත්වල ශුද්ධ වෙනස් වීම වූ රු.67,267,881ක් මුදල් ගලා යාම් ලෙස ගලපා තිබුණි. | එකඟ වන බව, 2024 වසරේදී අයෝජන මිලට ගැනීමට හා ඉවත් කිරීම් වෙන් වෙන් වශයෙන් දැක්වීමට පියවර ගනු ලබන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 73(අ) ඡේදයට අනුව, දේපළ පිරියත හා උපකරණ දාරන අගය තීරණය කරනු ලබන මිනුම් පදනම | එකඟ වන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනාවරණය කළ යුතු වුවත් වෛද්‍ය සභාව විසින් එය හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 61 වන ඡේදයට අනුව දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කළ යුතු වුවද එසේ නොකිරීම හේතුවෙන් තවදුරටත් භාවිතයට ගනු ලබන පිරිවැය රු.20,277,964 ක්වූ වත්කම්වල 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය ශුන්‍ය වී තිබුණි. | එකඟ වන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 19 හි 54 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වගකීමක් ලෙස හඳුනාගෙන ඇති සේවක ප්‍රතිලාභ වර්තමාන වටිනාකමට අගය කර දැක්විය යුතු බව දක්වා ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව, ගිණුම්කරණ ප්‍රමිති අංක 19, 57 වන ඡේදය ප්‍රකාරව පාරිතෝෂිත ගිණුම් ගත කිරීමට ඉදිරියේදී පියවර ගනු ලබන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෛද්‍ය සභාවේ ප්‍රතීතන අංශය වෙත ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ප්‍රදානයක් ලෙස 2022 ඔක්තෝබර් 03 දින ලැබී තිබුණු රු. 1,720,000 ක් වටිනා Toshiba color MFP e-studio 2510 AC යන්ත්‍රය සහ රු. 1,025,000 ක් වටිනා smart board 65 හි එකතුව රු. 2,745,000 ක පිරිවැය සහිත වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛනයටද ඇතුළත් කර නොතිබුණි. | එකඟ වන බව, ඔබගේ නිරීක්ෂණ පරිදි ප්‍රදාන ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ 6 (2) (අ) | සේවකයන් සඳහා පාරිතෝෂික ගෙවීමේ දී සම්පූර්ණයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුපට හෝ වේතනයට සමාන මුදලක් ගෙවිය යුතු වුවද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ 2007 නොවැම්බර් 15 දින පැවැති කළමනාකරණ කමිටු තීරණයක් අනුව වසරකට මාසය බැගින් පාරිතෝෂික ගෙවීමටත් මාසික වැටුප ගණනය කිරීමේදී සභා දීමනාව (Council Allowance) නොසලකා හැරීමටත් තීරණය කර තිබුණි. | එකඟ වන බව, ඔබ විසින් විගණන විමසුමේ සඳහන් කළ කළමනාකරණ කමිටු තීරණයට අනුව පාරිතෝෂිත ගණනය කිරීම් සිදු කර ඇති බව, ඔබගේ නිරීක්ෂණ පරිදි ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23(1)(අ) වගන්තිය | සභාව සඳහා තොරතුරු නිලධාරියෙකු පත්කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදයේ 1.1 වගන්තිය | වෙනත් අන්දමකට නියම කොට ඇති අවස්ථාවකදී හැර රජයේ නිලධරයන් කාර්යාල වලට පැමිණ රාජකාරි කළ යුතු සාමාන්‍ය කාර්යාල වේලාව, සියලුම වැඩ කරන දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා වුවද, සභාවේ සේවකයින්ගේ කාර්යාල වේලාව පෙ.ව. 9.00 සිට ප.ව.4.15 දක්වා විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |

| | | | | |
|---|---|---|---|---|
| i. | මුදල් රෙගුලාසි 135 | ගණන් දීමේ නිලධාරියෙකු විසින් තමාගේ කාර්යයන් පොදුවේ හෝ එක් එක් ගනුදෙනුව පවරා දෙනු ලැබිය හැකි වන අතර එහිදී මු.රෙ.135 (4) ප්‍රකාරව ක්‍රියාකළ යුතු වුවත් සභාව විසින් වියදම් දැරීම සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි. | එකඟ වන බව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව රාජ්‍ය ආයතනයක් ලෙස කටයුතු පවත්වා ගැනීමට 2023 වසරේදී අගභාගයේදී තීරණය කළ අතර එසේ හෙයින් මූල්‍ය රෙගුලාසි වලට පූර්ණ වශයෙන් අනුකූලව කටයුතු කිරීමට සාධාරණ කාලයක් අවශය වන බව, ඉදිරියේදී බලතල පැවරීම සම්බන්ධව අදාළ කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමර්ග ගනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 257 | සහතික කළ වවුචර සඳහා පමණක් ගෙවීම් කළ යුතු අතර වවුචර් සහතික කිරීමේ අධිකාරිය ලත් නිලධාරියෙකු විසින් නිසි පරිදි සහතික කොට ඇති බවට වගබලා ගැනීම වවුචර් අනුමත කරන හෝ මුදල් ගෙවන සෑම නිලධාරියෙකුම සතු කාර්යයක් වුවද සභාවේ ගෙවීම් වවුචර් නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 22 කදී රු. 6,922,850 ක සහතික නොකළ වවුචර් සඳහා ගෙවීම් කර තිබුණි. | එකඟ වන බව, සහතික කළ වවුචර් සඳහා පමණක් වර්ථමානයේදී ගෙවීම් කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iii. | මු.රෙ. 386 (6) | සියළුම චෙක්පත් ඇණවුමට ගෙවිය යුතු සේ ලියා රේඛනය කළ යුතු අතර විවෘත චෙක්පත් නිකුත් කිරීම සඳහා මාණ්ඩලික නිලධාරියෙකුගේ විශේෂ බලයක් අවශ්‍ය වේ. ඊට අනුකූල නොවන පරිදි සභාව විසින් අවස්ථා 90 කදී, රු. 14,994,066 ක් සඳහා මුදල් චෙක්පත් නිකුත් කර තිබුණි. | එකඟ වන බව, වර්තමානයේදී වෛද්‍ය සභාව විසින් සුළු මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා පමණක් විවෘත චෙක්පත් මඟින් ගෙවීම් සිදු කරනු ලබන බව, තවද සුළු මුදල් කටයුතු භාර නිලධාරීන්ගේ නමට අදාළ චෙක්පත නිකුත් කිරීමට ඉදිරියේදී පියවර ගනු ලබන බව, | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොත | | | |
| | i. 3.1 ඡේදය | කාර්යමණ්ඩලය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත් වෛද්‍ය සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මෙහෙයුම් අත්පොතෙහි දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | ii. 3.2 ඡේදය | සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය, වැටුප් ව්‍යුහය සහ දීමනා සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් එලෙසට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මෙහෙයුම් අත්පොතෙහි දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | iii. 3.3 ඡේදය | එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය හා සංවිධාන සටහන ඇතුළත් උපායමාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු වුවත් සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි | මෙහෙයුම් අත්පොතෙහි දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | iv. 3.4 (i) ඡේදය | රැකියා විස්තරය, අවශ්‍ය වෘත්තීය/අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, වයස් සීමාව යනාදි බඳවාගැනීම් සහ උසස්වීම් සඳහා යෝජනා ක්‍රමයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය යටතේ සකස් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි | මෙහෙයුම් අත්පොතෙහි දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| v. 3.6 ඡේදය | සභාව විසින් උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව ඵලදායි කාර්යසාධන ඇගයුම් පද්ධතියක් හඳුන්වා දිය යුතු අතර, එක් එක් සේවකයාගේ ඵලදායීතාවය ආසන්න නිලධාරියා විසින් ඇගයීමට ලක් කළ යුතු වුවද, සභාව සඳහා ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරින් වෙනුවෙන් කාර්යසාධන ඇගයුමකින් තොරව වාර්ෂික වැටුප් වර්ධක ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි | මෙහෙයුම් අත්පොතෙහි දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| vi. 6.6 ඡේදය | විගණන වාර්තාව සමග වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඇතුළත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් පසු මාස 05 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, වෛද්‍ය සභාව විසින් 2021 හා 2022 වාර්ෂික වාර්තාව 2024 මාර්තු 25 දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි | මෙහෙයුම් අත්පොතෙහි දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (උ) 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| i. 2.3 ඡේදය | උපාය මාර්ගික සැලැස්මක්, ක්‍රියාකාරි සැලැස්මක් හා වාර්ෂික අයවැය ලේඛනයක් සකස් කර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර එවා රේඛිය අමාත්‍යාංශ ලේකම්වරයා මාර්ගයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ii. 7.5 ඡේදය | ආයතනයක් විසින් කාර්තුමය වශයෙන්, අර්ධ වාර්ෂික සහ වාර්ෂිකවද කාර්යසාධන වාර්තා පිළියෙල කළ යුතු අතර, කාර්යසාධන වාර්තා අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්,සභාව විසින් කාර්යසාධන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඍ) | 2023 දෙසැම්බර් 11 දිනැති අංක PED/04/2023 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සභාවේ සේවකයින්/නිලධාරින් සඳහා 2023 වර්ෂය සඳහා පාලක සභා අනුමැතිය මත අප්‍රේල් හා දෙසැම්බර් මාස වලදී පිළිවෙලින් වැටුපෙන් භාගයක් සහ සම්පූර්ණ වැටුප බෝනස් මුදලක් වශයෙන් වර්ෂය තුළ රු 1,616,661 ක් ගෙවා තිබුණි. මෙම ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |
| (එ) | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය | වැටුප් හා දීමනා පිළිබඳ තීරණය කිරීමේ බලය පාලක මණ්ඩලය වෙත ලබාදී නොමැති අතර අමතර ගෙවීම් ලෙස සිදු කරනු ලබන සියලු දීමනා සඳහා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද 2018 පෙබරවාරි 23 හා 2022 අප්‍රේල් 20 දිනැති පාලක මණ්ඩල අනුමැතිය මත පිළිවෙලින් රු.8,700 ක හා රු.10,000 ක් වශයෙන් රු.18,700 ක මාසික දීමනාවක් සියලුම සේවකයින් සඳහා ගෙවිමට අනුමැතිය ලබාදී තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය | අස්ථිත්වයක් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු අතර අවම වශයෙන් වසර 03 කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කළ යුතු වුවද, වෛද්‍ය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද ,ඒ සමාලෝචිත වර්ෂය සඳහා පමණක් විය. | එකඟ වන බව, ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 200,262,651 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 280,427,245 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 80,164,594 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පිරිහීමට ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය ආඥා පනතේ 70 වන වගන්තිය අනුව මෙම ආඥා පනත මගින් පනවා ඇති සියලුම ගාස්තු වරින් වර රෙගුලාසි මගින් වැඩි කිරීමට හෝ අඩු කිරීමට හැකි බව දක්වා තිබුණද පනතේ දක්වා ඇති ගාස්තු වර්ග 09 ක් 2023 වර්ෂය වන විට අවස්ථා කිහිපයකදි සංශෝධනය කර තිබුණද, ඒ සඳහා රෙගුලාසි අනුමත කර රජයේ ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | එකඟ වන බව, අදාළ රෙගුලාසි සකස් කර ගැසට් පත්‍රයේ පල කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1927 අංක 26 දරන වෛද්‍ය ආඥා පනතේ 19 වන වගන්තිය අනුව පහත සඳහන් කරුණු සඳහා රෙගුලාසි පිළියෙල කළ යුතු බව දක්වා ඇති අතර ඒ අනුව රෙගුලාසි පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී නව රෙගුලාසි සැකසීමට හෝ පවතින රෙගුලාසි සංශෝධනය කිරීමට සභාව සුදුසු පියවර ගනු ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| පනතට යොමුව | කාරණය |
| --- | --- |
| --------- | ---------- |
| 19 (c) | වෛද්‍ය සභාවේ නිලධාරීන් සහ සේවකයන් පත්කිරීම, අත්හිටුවීම, ඉවත් කිරීම, රාජකාරි හා වේතන |
| 19 (d) | ලැබීම් සහ වියදම් පිලිබඳ ගිණුම් තැබීම සහ එවැනි ගිණුම් විගණනය කිරීම. |
| 19 (e) | වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් පවත්වාගැනීම ඇතුළුව මෙම ආඥා පනත යටතේ ලියාපදිංචිය ලබාගැනීමට පුද්ගලයෙකුට හිමිකම් ඇති ඕනෑම සුදුසුකමක් ප්‍රදානය කරන හෝ ප්‍රදානය කරන විශ්ව විද්‍යාල සහ වෙනත් ආයතනවල අධ්‍යයන පාඨමාලා, විභාග, කාර්ය මණ්ඩලය, උපකරණ, නවාතැන් පුහුණුව සහ අනෙකුත් පහසුකම් වලට අදාළ ප්‍රමිතීන් |
| 19 (f) | විශ්ව විද්‍යාල සහ අනෙකුත් ආයතනවල පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනයෙන් අවම ප්‍රමිතීන් පවත්වාගැනීම. |

(ඇ) පනතේ නිශ්චිතව සඳහන් නොවන කාරණා සඳහා ගාස්තු අය කිරීමට අදාළ නියෝග සකස් කර රජයේ ගැසට්පත්‍රයේ පළ කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතු වුවත්, පනතේ නිශ්චිතව සඳහන් නොවන ලියාපදිංචි හා සේවා ගාස්තු ලෙස අවස්ථා 50 කදී වෛද්‍ය සභාව විසින් අයකරනු ලබන ගාස්තු සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

එකඟ වන බව, අදාළ නියෝග සකස් කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව, වෛද්‍ය සභාව අයකරනු ලබන ගාස්තු සියල්ල අදාළ අයදුම් පත්‍ර සමඟ අප වෙබ් අඩවියේ දක්වා ඇති බව.

ආදායම් අයකිරීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතුය.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආඥාපනතේ 26 වගන්තිය අනුව සභාවේ ලියාපදිංචි දත්ත ඇතුළත් නාම ලේඛන නිවැරදිව යාවත්කාලීනව පවත්වාගත යුතු බවත්, ලේඛනයේ නම සඳහන් අයකු මිය ගිය විට ඔහුගේ නම අදාළ නාම ලේඛනයෙන් ඉවත්කළ යුතු බවත් දක්වා ඇති අතර එසේ මිය ගිය අයගේ නම් අදාළ ලේඛනවලින් ඉවත්කරගන්නා ක්‍රමවේදය විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | ආඥාපනතේ 26 වගන්තිය අනුව අදාළ තොරතුරු හා ලේඛන පවත්වා ගතයුතු බවත් මිය ගිය අයගේ නම් අදාළ ලේඛනවලින් ඉවත්කරගන්නා ක්‍රමවේදය විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු බවත් | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | දක්ෂ, මානුෂීය, සදාචාරාත්මක සහ ආරක්ෂිත සෞඛ්‍ය සේවා වෘත්තිකයන් විසින් රෝගීන්ට ප්‍රතිකාර කිරීම සහ ඔවුන් රැකබලා ගැනීම සහතික කිරීම දැක්ම කරගත්, රට පුරා සෞඛ්‍ය සේවාවේ අධ්‍යාපනයේ සහ භාවිතයේ ප්‍රමිතීන් සැකසීම, නඩත්තු කිරීම සහ ඉහළ නැංවීම මගින් මහජනතාවගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව තහවුරු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සිය මෙහෙවර කරගත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්යයන් ඉටුකිරීම පිණිස පත් කර ඇති සාමාජිකයන් 34 දෙනෙකුගෙන් යුතු පාලක සභාව විසින්, 2023 වර්ෂයේදී රැස්වීම් වාර 13 ක් පවත්වා තිබුණු අතර ඒ සඳහා පැමිණිය යුතු සාමාජික සංඛ්‍යාවෙන් රැස්වීම් සඳහා පැමිණි සාමාජික සංඛ්‍යාව සියයට 80 ඉක්මවූ වාර ගණන 07 ක් පමණක් විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පාලක සභා රැස්වීම් සඳහා සහභාගිත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සෞඛ්‍ය සේවා වෘත්තිකයන් විසින් ආරක්ෂිත සහ ඵලදායී සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා නියාමන පරිචයන් සහ පද්ධති සංවර්ධනය කිරීම, සෞඛ්‍ය සේවා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවලම් සංවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අධ්‍යයන පාඨමාලා විනිවිදභාවයෙන් ප්‍රතීතනය කිරීමෙන් ප්‍රමිතීන් සහතික කිරීම,සෞඛ්‍ය සේවකයින්ගේ විනය පවත්වා ගැනීම යනාදී වෛද්‍ය සභාව විසින් ඉටුකළ යුතු කාර්යභාරයන් සඳහා සභාව විසින් 2023 වර්ෂයේදී අනුකමිටු 15 ක් ක්‍රියාත්මක | පිළිතුරු ලබා දී නොතිබුණි. | අනු කමිටු රැස්වීම් සඳහා සහභාගිත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණි. සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී වෛද්‍ය සභාව විසින් පත්කරන ලද අනු කමිටු 15 හි රැස්වීම් පැවැත්වීම සමාලෝචිත වර්ෂයේදී සමාජිකයන් ගණන අවමය 02 ක් හා උපරිමය 16 ක් වන පරිදි විවිධාකාරයට රැස්වී තිබුණි. එසේම මෙම අනු කමිටු සඳහා කමිටු සමාජිකයින්ගේ පැමිණීමද සතුටුදායක මට්ටමක නොපැවතුණි. | | |
| (ඇ) | 1927 අංක 26 දරන වෛද්‍ය ආඥා පනතේ සඳහන් පහත වගන්ති 09 ක් අනුව වූ තනතුරු සම්බන්ධව වෛද්‍ය සභාවේ ලියාපදිංචි කටයුතු සිදු කරන අතර ඒ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | i 39 B වගන්තියේ ලියාපදිංචි වන විශේෂඥ වෛද්‍ය වෘත්තිකයන් හා විශේෂඥ දන්ත වෘත්තිකයන් සඳහා වෙනම දත්ත පද්ධතියක් භාවිතා නොවන අතර එය මූලික දත්ත පද්ධතියේම සටහන් කර තිබුණි. | SLMC දත්ත සමුදාය දැනට යාවත්කාලීන වෙමින් පවතින අතර ඉක්මනින් වැඩිදියුණු වනු ඇති බව. | සියළු ලියාපදිංචි තොරතුරු ඇතුළත් වන පරිදි දත්ත පද්ධතිය පවත්වා ගත යුතුය. |
| | ii සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ලියාපදිංචි කටයුතු සම්බන්ධව පවත්වාගෙන යන ලද දත්ත පද්ධතිය වෙත අදාළ නිලධාරියාගේ දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය, ඇතුළත් කළ නොහැකි වීම, නිලධාරියෙකුගේ නම වෙනස් කිරීමකදී අළුත් නම උඩුගත කළ පසුව භාවිතා කළ පැරණි නම සොයාගත නොහැකි වීම, වෛද්‍යවරුන් සම්බන්ධව ලබාගත් විශේෂඥතාවය සඳහන් කිරීමට පහසුකම් නොමැති වීම, අමතර සුදුසුකම් හා ඒවා ලබාගත් දිනයන් ඇතුළත් කිරීමට අවස්ථාව නොමැති වීම, ලියාපදිංචිය අළුත් කරන ලද දිනයන් සඳහන් නොවීම, මෙන්ම මෙම දත්ත පද්ධතියට ඇතුළත් කරන තොරතුරු word document ආශ්‍රයෙන් ගබඩා වීම හේතුවෙන් ඇතැම් තොරතුරු විශ්ව විද්‍යාල මට්ටමින්, විදේශීය වෛද්‍ය උපාධි ලබාගත් විස්තර මට්ටමින් විශ්ලේෂණය කර | -එම- | වැදගත් සියළු දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීනව පවත්වාගෙන යායුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබා ගැනීමට හැකියාවක් නොමැති වීම සහ දත්ත පද්ධතියේ ඇතුළත් කරන ලද නිලධාරින්ගේ ලියාපදිංචිය අක්‍රිය ද යන්න පිළිබඳ තොරතුරු ලබාගත නොහැකි වීම යනාදී අඩුපාඩු පවතින බව අනාවරණය විය. | | |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු මෙහෙයුම් අත්පොතේ 6-11 ඡේදය හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ සංග්‍රහයේ 3-1 ඡේදය ප්‍රකාරව මෙම අවශ්‍යතා සියල්ල සපුරාලන පරිදි වෛද්‍ය සභාවේ වෙබ් අඩවිය පවත්වා ගෙන නොතිබුණි. | SLMC දැනට වැඩිදියුණු කළ ත්‍රිභාෂා වෙබ් අඩවියක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින බව, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ ගිවිසුමක් අත්සන් කිරීමට දැනටමත් කටයුතු කර ඇති බව. | පරිශීලන හිතකාමී වෙබ් අඩවියක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යමණ්ඩල වෛද්‍ය රක්ෂණාවරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2023 ජූනි 15 සිට 2024 ජූනි 15 තෙක් වන කාලච්ඡේදය සඳහා LOLC සමාගමට රු. 2,240,274 ක් සභාව විසින් ගෙවා තිබුණු අතර මෙම රක්ෂණාවරණය සඳහා සභාවේ සේවකයන්ගෙන් කිසිදු දායකත්ව මුදලක් අය කර නොතිබුණි. සමස්ත වියදම සභාව විසින් දරන බවත් මේ සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබා ගෙන නොමැති බවත් අනාවරණය විය. මෙම රක්ෂණ ක්‍රමයට අමතරව සභාවේ අරමුදල් යොදවා වාර්ෂිකව එක් නිලධාරියෙකු වෙනුවෙන් රු.10,000 ක උපරිමයකට යටත්ව වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත තවත් වෛද්‍ය රක්ෂණ ක්‍රමයක්ද ක්‍රියාත්මක වන අතර මෙම වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහාද භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | එකඟ වන බව, අළුත් කිරීමට නියමිත කාර්ය මණ්ඩල රක්ෂාණාවරණ ක්‍රමය සඳහා සේවක දායකත්වය ලබා ගැනීමට අදාළ කටයුතු කරමින් පවතින බව, භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | අදාළ විධිමත් අනුමැතීන් ලබාගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 68 ක් වූ අතර විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2023 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 46 ක් විය. මේ අනුව 23 ක කාර්ය මණ්ඩල ඌණතාවයක් නිරීක්ෂණය වූ අතර මින් | විගණනයට ඉදිරිපත් කරන ලද විස්තර 2023.12.31 දිනට SLMC විසින් පුරවා ඇති කාඩ්පත මත පදනම් වන බව, 2022 වාර්ෂික වාර්තාවේ සඳහන් වන කවුන්සිලය අනුමත සේවක සංඛ්‍යාව EY වාර්තාව මත පදනම් වූ බව 2023 | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට හා අත්‍යවශ්‍ය නොවන තනතුරු යටපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අත්‍යාවශ්‍ය තනතුරු පිරවීමට හෝ අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ඔක්තෝබර් මාසයේදී DMS හි අනුමැතිය ඇතිව, දැනට පවතින පුරප්පාඩු 63 පිරවීමට SLMC පියවර ආරම්භ කර ඇති බව, සංක්‍රාන්ති කාලය තුළ පුරප්පාඩු පුරවා නැති බව. | |
| (ආ) | සභාවේ කාර්ය මණ්ඩලයේ විධායක හා කළමනාකරණ මට්ටමේ ප්‍රධාන තනතුරු 07 ක්ම කොන්ත්‍රාත් පදනම මත හෝ අර්ධ කාලීන වශයෙන් බඳවාගෙන තිබුණු අතර මෙම තනතුරු සඳහා ස්ථිර පදනම මත නිලධාරීන් බඳවා නොගැනීම සභාව විසින් ගනු ලබන තීන්දු තීරණවල වගකීම ගැනීම කෙරෙහි අහිතකර බලපෑමක් කරනු ලැබිය හැකි තත්ත්වයක් ඇති බව අනාවරණය විය. | ආරම්භයේ සිටම, SLMC කොන්ත්‍රාත් පදනම මත ප්‍රධාන තනතුරු පුරවා ඇති බව, මෙම තනතුරු සඳහා ලබාදෙන වේතනවල සීමාවන් හේතුවෙන් සුදුසුකම් ලත් පුද්ගලයන් එකී තනතුරුවලට ස්ථිර පදනමෙන් බඳවාගැනීම ප්‍රායෝගිකව කළ නොහැකි බව, ඇතැම් අවස්ථාවලදී ප්‍රධාන තනතුරු අර්ධකාලීන පදනමින් විශ්වවිද්‍යාල/ අනෙකුත් ආයතනවල ස්ථිර තනතුරු දරන කාර්ය මණ්ඩලයෙන් පුරවා ඇති බව. | නව කාර්යමණ්ඩලය හා බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුමත කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමුකළ යුතුය. |
| (ඇ) | 2022 හා 2023 වර්ෂවලදී පාලක සභාව විසින් අනුමත කරන ලද නව තනතුරු 10 ක් සඳහා 2024 මැයි 22 විගණිත දින වන විටත් නිලධාරීන් බඳවාගෙන නොතිබුණි. එසේම පාලක මණ්ඩලය විසින් අනුමත නොකරන ලද Preliminary Procedure Committee Coordinator නමින් තනතුරකට කාර්ය පැවරුම් පදනම මත නිළධාරියෙකු 2019 මැයි 31 දින සිට පත්කර තිබුණු අතර, ඔහුට රු.100,000 ක මාසික වැටුපක් ගෙවා තිබුණි. | EY වාර්තාව මත පදනම්ව SLMC විසින් මෙම නව සේවක තනතුරු අනුමත කරන ලද බව, කෙසේ වෙතත් 2023 අග භාගයේදී අපගේ ඉල්ලීම මත නීතිපති දෙපාර්තමේන්තුවෙන් මතය ලැබුණු අතර SLMC රජය සතු ව්‍යවසායයක් ලෙස වර්ගීකරණය කරන ලද අතර එතැන් සිට SLMC අදාළ රජයේ නීති රීති පිළිපැදීමට පටන් ගත් බව, සම්බන්ධීකාරක තනතුර 2019 දී සභාව විසින් අනුමත නොකළ බව අපි පිළිගන්නා බව, කෙසේ වෙතත්, නීතිපති දෙපාර්තමේන්තුවේ මතයෙන් පසුව, සම්බන්ධීකාරක තනතුර 2024 මුලදී සභාව විසින් අනුමත කරන ලද බව, පසුව, පැවරුම් පදනම මත මාස 3 ක කාලයක් සඳහා සම්බන්ධීකාරක වෙත පත්වීම් ලිපිය නිකුත් කරන ලද බව, SLMC හි අනාගත පත්වීම් සිදු කිරීමේදී නිසි බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සිදු කෙරෙනු ඇතිබව. | විධිමත් බඳවා ගැනීමේ පටිපාටියකට අනුකූලව සියළු බඳවා ගැනීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 වර්ෂයට අදාළව කාර්ය මණ්ඩලයට ගෙවන ලද වැටුප් පරීක්ෂාවේදී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණු බව අනාවරණය විය. | දැනට, SLMC කවුන්සිලයේ අනුමත සේවක සංඛ්‍යාව, අදාළ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) සහ නීතිපති දෙපාර්තමේන්තුවේ මතය ලබාගෙන සුදුසු වැටුප් පරිමාණයන්/ ව්‍යුහයන් සකස් කිරීම සඳහා කටයුතු කරමින් සිටින බව, සේවක සංඛ්‍යාව සහ වැටුප් ව්‍යුහය විධිමත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති බව. | සේවක සංඛ්‍යාව සහ වැටුප් ව්‍යුහය විධිමත් කළ යුතුය. |
| (ඉ) | අංක NSCC/8/13/402/S දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ ලිපියේ 05 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව රාජ්‍ය සංස්ථාවක් වන්නේ නම් අදාළ කරගත යුත්තේ රාජ්‍ය සංස්ථා අංශයේ වැටුප් සම්බන්ධයෙන් නිකුත් කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ බවත් දැනට සිටින නිලධාරින්ට මෙම වැටුප් ක්‍රමය පෞද්ගලික වනසේ ලබා දී ඉදිරියේදී බඳවා ගන්නා සේවකයින් සඳහා රාජ්‍ය සංස්ථා අංශයේ වැටුප් අදාළ කරගත යුතු වුවත් සභාව එම උපදෙස් පරිදි 2024 මැයි මස වන විටත් කටයුතු කර නොතිබුණි. | SLMC දැනට රාජ්‍ය ව්‍යවසාය සඳහා අදාළ වැටුප් ලබා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සටින බව, මෙම ගැටළු අනාගතයේදී නිවැරදි කරනු ඇති බව. | සේවක සංඛ්‍යාව සහ වැටුප් ව්‍යුහය විධිමත් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 ඡේදය අනුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු වුවද වෛද්‍ය සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ජී/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, වෛද්‍ය සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී එක් රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |